# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2326/12 - 2023 අප්‍රේල් මස 03 වැනි සඳුදා - 2023.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 21/1978 (x) (සී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ ස්ථාපිත කොට ඇති සහ ලියාපදිංචි අංක පී.වී. 115017 දරන අංක 495, මිනුවන්ගොඩ පාර, බෝලවලාන, මීගමුව දරන තැන පිහිටා ඇති, උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේශන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2002 ඔක්තෝබර් මස 10 වන දින අංක 2301/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන ''මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව'' යන සටහනට හා II වන තීරයේ ඊට අනුරූපී සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේශන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, (එස්එල්කිව්එෆ් හි 6 වන ස්ථරයේ) අවම අධ්‍යන සම්භාර 120ක් සහිත ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගත යුතු ය. ඇතුළත් කරගැනීමේ අවම සුදුසුකම විය යුත්තේ -

   (අ) අධ්‍යන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ සමාන සුදුසුකමක්; සහ

   (ආ) අධ්‍යන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ සමාන සුදුසුකමක්.

2. බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සිදු කරනු ලබන ආයතනයක් වශයෙන් පිළිගනු ලැබේ.

3. මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් පැවැත්විය යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම්* |
|---|---|
| ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඑඩ් ගෞරව (ප්‍රාථමික අධ්‍යාපනය) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2023 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0025

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.